# ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය-දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සේවාවන් සදහා යොමු කිරීම් ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශයන්

# Contents

කෙටි යෙදුම් ....................2
විවිධ යෙදුම් සහ නිර්වචන ....................3
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ආකාරයන ....................4
ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ආකාරයන් ....................5
හැඳින්වීම ....................7
අරමුණු ....................8
ක්‍රමවේදය ....................8
මූලික හේතුව (තාර්කිකත්වය) ....................10
ඉලක්ක කණ්ඩායම ....................12
නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුව ....................13
මෙහෙයුම් මූලධර්ම ....................15
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොරිට්ඨාස මට්ටමේ යොමු කිරීමේ පද්ධතියඃ ....................18
ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන කෙරෙහි බහු-ආංශික ප්‍රතිචාර දැක්වීම පිණිස වන කොට්ඨාස මට්ටමේ ව්‍යුහය ....................19
යොමු කිරීමේ පද්ධතියක අත්‍යාවශ්‍ය අංග ....................21
අත්‍යාවශ්‍ය අංග 1ඃ යොමු කිරීමේ ජාලය ....................22
අත්‍යාවශ්‍ය අංග 2ඃ හඳුනාගත් සම්බන්ධීකරණ නියෝජිත ආයතනය :WDO) ....................23
අත්‍යාවශ්‍ය අංග 3ඃ යොමු කිරීමේ මාර්ගය ....................23
අත්‍යාවශ්‍ය අංග 4ඃසෑම සේවා සැපයුම් අංශයකින්ම හඳුනාගත් කේන්ද්‍රීය නිලධාරියෙක් ....................24
අත්‍යාවශ්‍ය අංග 5ඃ සේවා සපයන්නන්ගේ නාම ලේඛනයක් ....................24
අත්‍යාවශ්‍ය අංග 6ඃප්‍රමිතිගත යොමු කිරීමේ ආකෘති ....................24
අත්‍යාවශ්‍ය අංග 7ඃයොමු කිරීම් පිළිබඳ පසුවිපරමක් ....................25
අත්‍යාවශ්‍ය අංග 8ඃසම්බන්ධීකරණ රැස්වීම් ....................25
ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ කොට්ඨාස හා දිස්ත්‍රික් මට්ටමේ යොමු කිරීමේ මාර්ගය සහ සිද්ධි කළමනාකරණය ....................26
සේවා සපයන්නෙකුගේ සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය ....................39
ලිංගික සූරාකෑම සහ අපයෝජනය වැළැක්වීම (PSEA) ....................43
**ඇමුණුම 1ඃ ආකෘති සාම්පලය - තොරතුරු මුදා හැරීමට කැමැත්ත පළ කිරීම** ....................44
**ඇමුණුම 2ඃ ආකෘති සාම්පලය - ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ දිස්ත්‍රික් හා ප්‍රා.ලේ.කො මට්ටමේ සේවා සිතියම්කරණය** ....................45
**ඇමුණුම 3ඃ ආකෘති සාම්පලය - දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සේවා නාමාවලිය** ....................49
**ඇමුණුම 4ඃ ආකෘති සාම්පලය - ප්‍රමිතිගත යොමු කිරීමේ ආකෘතිය** ....................50
**ඇමුණුම 5ඃ ආකෘති පත්‍රය - ලිංගිකත්වය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය සම්බන්ධ සිදුවීම්වලදී දිස්ත්‍රික් මට්ටමින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග හා ප්‍රතිචාර** ....................51

## කෙටි යෙදුම්

| | |
|---|---|
| **CPO** | - ළමා ආරක්ෂණ නිලධාරී |
| **CA** | - උපදේශන සහකාර |
| **CO** | - උපදේශන නිලධාරී |
| **CRPO** | - ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී |
| **CSO** | - සිවිල් සමාජ සංවිධාන |
| **CWDU** | - ළමා හා කාන්තා සංවර්ධන ඒකකය |
| **DV** | - ගෘහස්ත හිංසනය |
| **PDVA** | - ගෘහස්ත හිංසන වැළැක්වීමේ පනත |
| **GBV** | - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන |
| **GN** | - ග්‍රාම නිලධාරී |
| **LAC** | - නීති ආධාර කොමිසම |
| **MOMCH** | - මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| **MOH** | - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| **NCPA** | - ජාතික ළමාරක්ෂණ අධිකාරිය |
| **PSEA** | - ලිංගික සූරාකෑම සහ අපයෝජනය වැළැක්වීම |
| **SGBV** | - ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන |
| **WDO** | - වනිතා සංවර්ධන නිලධාරී |
| **WDFA** | - වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර |
| **W & C Desk** | - කාන්තා හා ළමා කාර්යාංශය - පොලිස් |
| **UNFPA** | - එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල |
| **ESP** | - අත්‍යාවශ්‍ය සේවා පැකේජය |
| **GAC** | - ගෝලීය කටයුතු සඳහා වන කැනඩා අරමුදල |
| **ICCPR** | - සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යාන්තර සම්මුතිය |
| **ICESCR** | - ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යාන්තර සම්මුතිය |
| **CRC** | - ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| **CAT** | - වද හිංසා පැමිණවීම සහ වෙනත් කෲර, අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවම් වලට එරෙහි සම්මුතිය |
| **CADAW** | - කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය |

## විවිධ යෙදුම් සහ නිර්වචන

**අත්‍යාවශ්‍ය සේවා -** අත්‍යාවශය සේවාවන් යනු සෞඛ්‍යය සේවා, සමාජ සේවා හා පොලිස් සහ යුක්තිමය සේවා යන අංශ විසින් සපයනු ලබන මුලික සේවා සමූහයකි. අවම වශයෙන් මෙම සේවාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන අත්විඳින ඕනෑම කාන්තාවකගේ හෝ ගැහැණු ළමයෙකුගේ අයිතිවාසිකම්, ආරක්ෂාව සහ යහ පැවැත්ම සුරක්ෂිත කල යුතුය[1].

**සම්බන්ධීකරණය -** කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම පිණිස නීති, ප්‍රතිපත්ති, විධි චර්‍යා සහ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මෙන්ම සන්නිවේදනය හා සහයෝගීතාවයන් පවත්වා ගෙන යාම සඳහා අදාල සියළු අංශවල බහු-විනය කණ්ඩායම්, පුද්ගලයින් සහ ආයතන ආදිය මගින දරණ සාමූහික ප්‍රයත්නයකි[2].

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය-** ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු කාන්තාවන් සහ පිරිමින් පිළිබඳව සමාජය විසින් ගොඩනගා ඇති ලක්‍ෂණයන්ය. එනම්; ඔවුනොවුන් පිළිබඳ සමාජ සම්මතයන්, ඔවුන්ට පවරා ඇති භූමිකාවන් සහ කාන්තාවන් සහ පිරිමින් අතර පවතින සබඳතාවයන්ය, මෙය සමාජයෙන් සමාජයට විවිධාකාර වන අතර වෙනස් කල හැකි තත්වයකි[3].

**පාර්ශවනරුවන් -** කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි හිංසනයන් කෙරෙහි ප්‍රතිචාර දැක්වීමේ කාර්යභාරයක් ඇති සෑම තරාතිරමකම රාජ්‍ය සහ සිවිල් සමාජ සංවිධාන සහ අනෙකුත් ආයතන පාර්ශවකරුවන් සේ සැලකේ. ප්‍රධාන පාර්ශවකරුවන් අතරට; වින්දිතයින් සහ අගතියට පත්වූවන්, ඔවුන්ගේ නියෝජිතයින්, සමාජ සේවා, සෞඛ්‍යය සේවා අංශය, නීති ආධාර සපයන්නන්, පොලිසිය, නඩු කටයුතු මෙහෙයවන්නන්, විනිසුරුවන්, ළමා ආරක්ෂණ ආයතන සහ අධ්‍යාපන අංශය ආදිය ඇතුළත්වේ[4].

**වින්දිතයා/අගතියට පත් අය -** ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය අත්විඳ ඇති හෝ දැනටත් අත්විඳිමින් සිටින කාන්තාවන් සහ ගැහැණු ළමුන් හැඳින්වීම සඳහා නීතිමය ක්‍රියාවලියේදී මෙන්ම ඔවුන් සිය අත්‍යාවශ්‍ය සේවා පිණිස යොමු වන නියෝජිත ආයතන විසින් මෙම යෙදුම් දෙකම යොදා ගනු ලැබේ[5].

**යොමු කිරීමේ පද්ධති -** ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයේ වින්දිතයෙකු/අගතියට පත් අයෙකු සුදුසු, ගුණාත්මක බහු-ආංශික සේවා වෙත නිසි කලට සහ ඔවුන්ගේ පුද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරාක්‍ෂා වන ආකාරයෙන් යොමු කල හැකි පරිදි ස්ථාපිතව ඇති පද්ධති මෙලෙෂ

[1] https://www.unfpa.org/sites/default/files/pub-pdf/Essential-Services-Package-en.pdf
[2] https://www.unfpa.org/sites/default/files/pub-pdf/Essential-Services-Package-en.pdf
[3]: WHO https://www.who.int/gender-equity-rights/understanding/gender-definition/en/
[4] https://www.unfpa.org/sites/default/files/pub-pdf/Essential-Services-Package-en.pdf
[5] https://www.unfpa.org/sites/default/files/pub-pdf/Essential-Services-Package-en.pdf

හඳුන්වනු ලැබේ. මේ සඳහා අවම වශයෙන්; (1) මනා සුදුසුකම් ගත් බහු-ආංශික සේවා සපයන්නන්ගේ ජාලයක් සහ (2) වින්දිතයා/අගතියට පත් අයට නිසි කලට, ආරක්ෂිත හා රහස්‍යභාවයෙන් යුතු සේවා කෙරෙහි ප්‍රවේශ වීම සඳහා සහාය වන සේ ස්ථාපිත යොමු කිරීමේ මාර්ගයක් හෝ පද්ධතියක් අවශ්‍ය වේ[6].

**යොමු කිරීමේ මාර්ගය -** ''යොමු කිරීමේ මාර්ගය'' යනු වෛද්‍ය ප්‍රතිකාර, මානසික සෞඛ්‍යය සහ මනෝ-සමාජීය සහය, පොලිස් සහය මෙන්ම නීතිමය/යුක්තිය සඳහා වන කාර්යක්ෂම උපකාරක සේවාවන් කෙරෙහි වින්දිතයින් ආරක්ෂිතව සම්බන්ධ කරවන නම්‍යශීලී යාන්ත්‍රණයකි[7].

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ආකාරයන[8]

**ලිංගික අපයෝජනය** යනු වින්දිතයාගේ ස්වකීය කැමැත්තෙන් හෝ මනාපයෙන් තොරව සිදුවන ලිංගික ක්‍රියාවකි. එම ක්‍රියාව සිදුව ඇත්ද? නොසළකා හැර; යම් රෝගී තත්වයන්, ආබාධිතභාවය, මත්පැන් හෝ මත්ද්‍රව්‍යවල බලපෑම (මානසික තත්වය වෙනස් කරවන සුළු ද්‍රව්‍ය), වයස, බිය ගැන්වීම, අවමන් සහගත තර්ජනයන් හෝ පීඩණයට පත් කිරීම ආදී තත්වයන් මත පුද්ගලයෙකුට ප්‍රතික්ෂේප කිරීමට නොහැකි අවස්ථාවකදී එවැනි වේදනාකාරී හා බලහත්කාර ක්‍රියාවකට තැත් කිරීම හෝ වුවද ලිංගික හිංසනයක් හෝ ලිංගික අපයෝජනයක් සේ සැලකේ. අනවශ්‍ය ලිංගික හැසිරීමකට පොළඹවා ගැනීම පිණිස බිය ගැන්වීම, අපහාසාත්මක ලෙස තර්ජනය කිරීම හෝ පීඩණයට පත් කිරීම යන්නට; වින්දිතයට වේදනා ඇති කිරීමේ, තුවාල හෝ මරණයට පත් කිරීමේ අභිප්‍රායෙන් හෝ තර්ජනය කිරීම සඳහා වචන , අභිනය (ඉඟි) හෝ ආයුධ හා වෙනත් උපකරණ භාවිතා කිරීම ඇතුළත්වේ. ස්ත්‍රී දූෂණය, බරපතල ලිංගික අපයෝජනය, ලිංගික හිරිහැර සහ ලිංගික සූරා කෑම ශ්‍රී ලංකාවේ බහුලව සිදුවන ප්‍රධාන සාපරාධී ලිංගික අපයෝජන අපරාධයන්ය.

**කායික හිංසනය** යනු ශාරීරිකව වේදනාවට පත් කිරීම, තුවාල, ආබාධිතභාවය හෝ මරණය පවා ඇති කල හැකි ආකාරයෙන් හිතාමතාම ශාරීරික බලය භාවිතා කිරීමයි. සීරීම, තල්ලු කිරීම, කොණ්ඩයෙන් ඇදීම, කම්මුල් පහර ගැසීම, පහර දීම, පයින් ගැසීම, සපා කෑම, ගෙල සිර කිරීම, පිහියෙන් ඇනීම, පිළිස්සීම, ඔබමොබ යාමට සීමා පැනවීම, වස විස පෙවීම සහ මරණයට පත් කිරීම ආදී ක්‍රියාවන් ඊට ඇතුළත්ය.

**මානසික හිංසනය/චිත්තාවේගීය අපයෝජනය** යනු ශාරීරිකව තුවාල සිදුකල හැකි මෙවලම් හෝ ආයුධ භාවිතා කොට හෝ එවැන්කින් තොරව හැසිරීම, තර්ජනය සහ බිය ගැන්වීමේ ක්‍රම හරහා වින්දිතයාගේ මානසික සන්සුන් භාවය උල්ලංගණය කිරීමයි. නින්දා කිරීම, ඇගේ හැසිරීම පාලනය කිරීම, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීම, ලැජ්ජාවට හා අපකීර්තියට පත් කිරීම, දොස් පැවරීම, මිතුරන්ගෙන් හා පවුලේ ඥාතීන්ගෙන් හුදකලා කිරීම, දරුවන් ඇසුරු කිරීම පාලනය කිරීම සහ මුදල්

[6]UNFPA's The Inter-Agency Minimum Standards for Gender-Based Violence in Emergencies Programming, 2019
[7]IASC-Gender-based-Violence-Guidelines, 2015

[8]https://www.unfpa.org/sites/default/files/pub-pdf/GBV%20E-Learning%20Companion%20Guide_ENGLISH.pdf

සහ සම්පත් කෙරෙහි ඇති ප්‍රවේශය සහ පාලනය අවහිර කිරීම ආදී වශයෙන් වින්දිතයාගේ මානසික හා චිත්තාවේගීය තත්වයට බලපාන ක්‍රියාවන් ඊට ඇතුළත්ය.

**වාචික හිංසනය** යනු භාෂාව භාවිතා කිරීම සම්බන්ධ හිංසාකාරී හැසිරීමකි. එය අසභ්‍ය වචන භාවිතා කර හෝ එසේ නොකොට සිදුවනු දැකගත හැකි නින්දාවට හෝ අපහාසයට පත් කිරීමකි. අනවර්ථ නාමයන් යොදා ගනිමින් ඇමතීම, පහත් කොට සැලකෙන හෝ බියගන්වන සුළු ආකාරයේ වචන වලින් කතා කිරීම මෙන්ම ලබන්නාට හිරිහැරයක් වන පරිදි ලිඛිත ස්වරූපයේ අපවාදාත්මක හා පරිභවසහගත වචන ඇතුළත් වේ.

**ආර්ථික හිංසනය යනු** පොදු සම්පත් කෙරෙහි අසමාන ප්‍රවේශය, මුදල් සඳහා ඇති ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම හෝ පාලනය කිරීම, රැකියාව හෝ අධ්‍යාපනය හා වෘත්තීය දියුණුව වැළැක්වීම, දේපල අයිතිය අහිමි කිරීම මෙන්ම දේපල අයිතිය පැවරීමට බලපෑම් කිරීම සහ කැමැත්තෙන් හෝ අවසරයකින් තොරව දේපල අන්සතු කිරීම ඇතුළු මානසික හිංසනයකි.

## ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ආකාරයන්

**ගෘහස්ත හිංසනය/සමීප සහකරු හිංසනය** - සමීප ලිංගික හවුල්කරුවන් (කලත්‍රයන්/පෙම්වතා/පෙම්වතිය) අතර මෙන්ම අනෙකුත් පවුලේ සාමාජිකයින් අතර සිදුවන හිංසනය මෙලෙස හඳුන්වයි. මෙම ආකාරයේ හිංසනයන්ට ශාරීරික, ලිංගික සහ/හෝ මානසික අපයෝජන මෙන්ම සම්පත්, අවස්ථාවන් හෝ සේවාවන් කෙරෙහි වන ප්‍රවේශය අවහිර කිරීම ද ඇතුළත් විය හැක.

*ශ්‍රී ලංකා නීතියේ දී, පුද්ගලයෙකුට එරෙහිව ශාරීරික හිංසනය යනු දණ්ඩ නීති සංග්‍රහයේ xvi වන පරිච්ඡේදයේ විස්තර කර ඇති පරිදි මිනිස් සිරුරට එරෙහි වැරදි, 372 වගන්තියේ සඳහන් යමක් බලහත්කාරයෙන් ලබා ගැනීම සහ දණ්ඩ නීති සංග්‍රහයේ 483 වන වගන්තියේ සඳහන් සාපරාධී බිය ගැන්වීම සහ ඊට උත්සාහ කිරීම සහ මෙකී අපරාධයන්ගෙන් කිසිවක් සිදු කිරීමට තැත් කිරීමයි. මෙම ක්‍රියාවන් සාපරාධී අපරාධ සේ සැලකිමට අමතරව,2005 අංක 34 දරණ ගෘහස්ත හිංසන වැළැක්වීමේ පනතට (PDVA) අනුව, ගෘහස්ත සම්බන්ධතාවයකට අදාළව යමෙකු විසින් සිදු කරනු ලබන ඉහත අපරාධ වලින් ආරක්ෂා වීම සඳහා ආරක්ෂණ නියෝග ලබා ගත හැකිය. එමෙන්ම, මානසික හිංසනය ''අගතියට පත් පුද්ගලයෙකු වෙත කෙරෙන බරපතළ ස්වභාවයේ කෲර, අමානුෂික, පහත් හෝ නින්දාසහගත හැසිරීම් රටාවක්'' බව ගෘහස්ත හිංසන වැළැක්වීමේ පනත හඳුනා ගනී.*

**ස්ත්‍රී දූෂණය** යනු කැමැත්තෙන් තොරව ලිංගික සංසර්ගයෙහි යෙදීම හෝ යෝනි මාර්ගය විනිවිද යාමක් සිදුවන පරිදි ලිංගික හැසිරීමකි.

**ව්‍යවස්ථාපිත දූෂණය** යනු යමෙකුට තමා සමග ලිංගිකව හැසිරීමට එකඟතාවය ලබා දීමට නීතිමය වශයෙන් නියම කර ඇති වයස අවුරුදු 16 බැවින්, අවුරුදු 16 ට අඩු ගැහැණු ළමයෙකු හා ලිංගිකව හැසිරීම හරහා වන ස්ත්‍රී දූෂණයයි.

**භාරකාර ස්ත්‍රී දූෂණය** යනු වින්දිතයා හෝ අගතියට පත් තැනැත්තා ''අත් අඩංගුවේ'' පසුවන හෝ රැඳවුම් භාරයේ සිටින අතරතුර සිදුවන ස්ත්‍රී දූෂණයකි. මෙහිදී දූෂකයා හෝ දූෂකයෝ අදාළ වින්දිතයා ''අත් අඩංගුවේ'' හෝ රැඳවුම් භාරයේ තබාගෙන සිටීමේ බලය ඇති අයවේ.

**සමූහ දූෂණය** යනු පුද්ගලයින් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවකින් සැදුම්ලත් කණ්ඩායමක් ලෙස එක්ව, එම කණ්ඩායමේ සෑම පුද්ගලයෙකුම අදාළ දූෂණය සිදු කිරීම සහ/හෝ ඊට අනුබල දෙමින් කරන ස්ත්‍රී දූෂණයකි.

**වෛවාහක ස්ත්‍රී දූෂණය** යනු යමෙකු සිය බිරිඳට එකඟවීමට නොහැකි හෝ ඇය එකඟවීමට අකමැති අවස්ථාවකදී බලහත්කාරයෙන් හෝ බලහකාරී ලෙස තර්ජනය කරමින් කිසියම් අනවශ්‍ය ලිංගික සංසර්ගයක් හෝ යෝනි මාර්ගය විනිවිද යාමක් වන පරිදි සිදුකරන ලිංගික ක්‍රියාවකි.

**බරපතල ලිංගික අපයෝජනය** යනු වින්දිතයාගේ කැමැත්තෙන් තොරව ගුද මාර්ගය, මුඛය හෝ කලව යොදා ගනිමින් පුරුෂ ලිංගේන්ද්‍රිය හෝ වෙනත් ශරීර අවයවයකින් ලිංගික බලහත්කාරයක් සිදු කිරීමයි. මෙහිදී යම් වස්තුවක් මගින් යෝනි මාර්ගය හෝ ගුද මාර්ගය විනිවිද යාම ද ඇතුළත් වේ.

**ව්‍යභිචාරය** නීතියෙන් අර්ථ දක්වා ඇත්තේ රුධිරය හෝ විවාහය සමග සමීප සම්බන්ධතාවයක් ඇති පුද්ගලයින් අතර ලිංගික සංසර්ගයයි. නීත්‍යානුකූලව දරුකමට හදා ගැනීම පිළිබඳ තත්වයන් වලදී ද ව්‍යභිචාරය අදාළ වේ[9].

**ලිංගික හිරිහැරය** යනු කවරෙකු හෝ අඩන්තේට්ටම් කිරීමකින් හෝ සාපරාධී බලය පෑමෙන් වෙනත් පුද්ගලයෙකුට ලිංගික හිරිහැර හෝ කරදර සිදු කිරීමයි. වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් බලධාරියෙකු, රාජකාරී ස්ථානයක හෝ වෙනයම් ස්ථානයක යමෙකු අකමැති හා අනපේක්ෂිත ලිංගික ආක්‍රමණයන් සාපරාධී වරදක් ලෙස සැලකේ[10].

*මෙම ස්වභාවයේ ක්‍රියාවක් භාවිතා කරමින් සිදු කරන අපරාධ ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන වගන්තියට යටත් වේ.*

**පුද්ගල ජාවාරම/කුට්ටනය** යනු බලහත්කාරයෙන් හෝ පැහැරගෙන යාම, වංචා කිරීම, රැවටීම, බලය හෝ තනතුරක අවදානම්පාත්‍රීභාවය අයුතු ලෙස භාවිතා කිරීම ආදී වෙනත් ආකාරයක බලහත්කාරය පෑමකින් පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, ස්ථාන මාරු කිරීම් හෝ පුද්ගලයින් ලබා ගැනීම හෝ සූරා කෑමේ අරමුණින් යමෙකු යටතේ පාලනය වන පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම පිණිස ගෙවීම් හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දීමයි. සූරාකෑම යන්නට අවම වශයෙන්, අන්‍යන්ගේ වාණිජ ලිංගික වෘත්තිය සූරාකෑමට ලක් කිරීම හෝ වෙනත් ආකාරයන්ගේ ලිංගික සූරාකෑම්, බලහත්කාරයෙන් ශ්‍රමය හෝ සේවා වල යෙදවීම, වහල්භාවයේ යෙදවීම හෝ වහල්භාවයට සමාන භාවිතයන්, දාසකම හෝ අවයව ලබා ගැනීම පිණිස යොදා ගැනීම ආදිය ඇතුළත් වේ.

---

[9]https://www.actnowsrilanka.info/incest/

[10]***Section 345 of the Penal Code of Sri Lanka***

*ස්ත්‍රී දූෂණය, බරපතළ ලිංගික අපයෝජනය, ව්‍යභිචාරය, ලිංගික හිරිහැරය සහ පුද්ගල ජාවාරම/කුට්ඨනය ආදිය දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධයන් සේ සැලකෙන ක්‍රියාවන් කිහිපයකි. මේවා ශාරීරික හිංසන ලෙසද සැලකිය හැක.*

**හානිකර සාම්ප්‍රදායික පිළිවෙත් -** පුද්ගලයෙකුගේ මානසික හෝ ශාරීරික සෞඛ්‍යයට හානිකර විය හැකි සංස්කෘතික, සමාජීය හා ආගමික සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් මෙසේ හඳුන්වයි. එය බොහෝ විට භාවිතා කරනුයේ කාන්තා ලිංගික චර්ම ඡේදනය/විකෘති කිරීම හෝ අඩු වයස්/බලහත්කාර විවාහය යන සන්දර්භය තුළය. ළමයින්ට බලපාන අනෙකුත් හානිකර සම්ප්‍රදායික පිළිවෙත් අතරට බැඳ දැමීම, කැළැල් ඇති කිරීම, පිලිස්සීම, හංවඩු ගැසීම, ප්‍රචණ්ඩත්වය උද්දීපනය කෙරෙන වත් පිළිවෙත්, තරබාරු කිරීම, බලහත්කාර විවාහ, ඊනියා ''ගෞරවය'' පිණිස කෙරෙන වත් පිළිවෙත් හා සම්බන්ධ අපරාධ සහ දැවැද්ද ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය ඇතුළත් වේ.

## හැඳින්වීම

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (SGBV) හි වින්දිතයින් සඳහා පලදායී, ඒකාබද්ධ හා මනාව සම්බන්ධීකරණය වූ බහු-ආංශික සේවා ප්‍රතිචාරයක් ලබා ගැනීම පිණිස දිස්ත්‍රික් හා කොට්ඨාස මට්ටමේ යොමු කිරීමේ පද්ධතියක් සඳහා පියවරෙන් පියවර උපදෙස් සැපයීම මෙම මාර්ගෝපදේශයේ අරමුණයි.

වර්ෂ 2017 සිට මේ දක්වා මන්නාරම සහ හම්බන්තොට දිස්ත්‍රික් හා කොට්ඨාශ මට්ටමේ රාජ්‍ය හා සිවිල් සමාජ පාර්ශවකරුවන් සමග පුළුල් සාකච්ඡා[11] මෙහෙයවීමෙන් අනතුරුව මෙම මාර්ගෝපදේශ සකස් කර ඇති අතර ඒ සඳහා අදාළ දිස්ත්‍රික්ක තුළ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක් යොදා ගෙන ඇත [12]. මෙම මැදිහත්වීම එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) හි තාක්ෂණික සහය ඇතිව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ වැඩසටහන් පරාසය යටතේ මෙහෙයවන කාර්යයේ එක් කොටසකි. මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී මන්නාරම සහ හම්බන්තොට දිස්ත්‍රික්ක කෙරෙහි අවධානය යොමු කර ඇතත්, එය වෙනත් දිස්තික්ක සහ කොට්ඨාසවල ද ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන (SGBV) සඳහා යොමු කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීම හා ප්‍රතිවර්තනය පිණිස භාවිතා කල හැක.

මෙම මාර්ගෝපදේශයන් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන කෙරෙහි ප්‍රතිචාර දැක්වීම සඳහා සංවර්ධනය කරන ලදුව අදාළ අංශ තුළ දැනට පවත්නා මාර්ගෝපදේශ හා පටිපාටීන් ප්‍රතිස්ථාපනය නොකරයි. පලදායී යොමු කිරීම් සිදුකිරීමේ දී දිස්ත්‍රික් නිලධාරීන්ගේ සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යභාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන වල වින්දිතයින්ට/අගතියට පත්වූවන්ට පුළුල් හා කාලෝචිත සේවාවන් සැපයීම පිණිස ව්‍යුහාත්මක රාමුවක් තුළ සියලු අංශ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම

[11] 21 divisional level meetings in 8 divisions and 2 district level meetings

[12] Tangalle Ds, Hambantota DS, Suriyawewa DS and Lunugamwehera DS in Hambantota District and MusaliDS ,Nannatan DS, Mannar town DS and Manthai west DS in Mannar district

සහතික කිරීම අපේක්ෂාවෙන් මෙය සම්පාදනය කෙරේ. තවද, කලාපය විසින් සංවර්ධනය කරන ලද හොඳම භාවිතයන් මෙන්ම එක්සත් ජාතීන්ගේ අත්‍යාවශ්‍ය සේවා පැකේජය[13] (ESP) මෙම මාර්ගෝපදේශ මගින් පිළිබිඹු කරයි. මෙම අත්‍යාවශ්‍ය සේවා පැකේජය 2018 ජූනි මාසයේදී බහු-පාර්ශවීය වැඩමුළුවකදී ප්‍රමුඛ පෙළේ අමාත්‍යාංශ සහ එක්සත් ජාතීන්ගේ සෙසු නියෝජිත ආයතන සමග එක්ව ශ්‍රී ලංකාවේ දී දියත් කරන ලද අතර ශ්‍රී ලංකාව අත්‍යාවශ්‍ය සේවා පැකේජය ස්වයංව ආරම්භ කරන ලද රටකි. එසේම, මෙම මාර්ගෝපදේශ සකස් කිරීමේ දී පෙර සඳහන් වැඩමුළුවේ උකහා ගැනීම් ද සලකා බලන ලදි.

මෙම මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සඳහා ගෝලීය කටයුතු පිළිබඳ කැනඩා අරමුදල (GAC) මගින් සපයන ලද මූල්‍ය සහාය යොදා ගන්නා ලද අතර ''එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ 9 වන රට'' වැඩසටහනට අනුකූලව සිදු කරන ලදි.

## අරමුණු

- ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්හි වින්දිතයින් සහ අගතියට පත්වූවන් සඳහා ගුණාත්මක සත්කාරයන් සැපයීම සහ වින්දිතයින් යථා තත්වයට පත් කිරීම සහ ප්‍රජාව වෙත ප්‍රති-සමාජගත කිරීම පිණිස පහසුකාරිත්වය සැපයීම
- දිස්ත්‍රික් හා කොට්ඨාස මට්ටමේ යොමු කිරීමේ මාර්ග විධිමත් කිරීම තුළින් බහු-ආංශික ක්‍රියාකරුවන් විසින් පලදායී යොමු කිරීම් හා සේවා සැපයීම සම්බන්ධීකරණය කිරීම
- ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්හි වින්දිතයින් සඳහා ගුණාත්මක සේවාවන්ට ආරක්ෂිත හා කාලෝචිත ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම

## ක්‍රමවේදය

හම්බන්තොට සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙක සහ එම දිස්ත්‍රික්ක තුළින් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 සඳහා මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය 2017 දී ආරම්භ කරන ලදි.

දිස්ත්‍රික්ක දෙකෙහි වනිතා සංවර්ධන නිලධාරීන් (WDOs) සම්බන්ධ වීමත් සමග, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් කෙරෙහි සේවා සපයන්නන් සිතියම්කරණය පුද්ගලික සම්මුඛ සාකච්ඡා හරහා රැස් කරගත් තොරතුරු අනුසාරයෙන් සම්පූර්ණ කරන ලදි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සේවා සපයන්නන් 128 දෙදෙනෙකු සහ මන්නාරම දිස්ත්‍රික්කයෙන් සේවා සපයන්නන් 95 දෙනෙක් සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කර හඳුනා ගනිමින් 2018 දී සම්පාදනය සේවා සපයන්නන්ගේ නාමාවලියට ඇතුළත් කල අතර එම නාමාවලිය අර්ධ-වාර්ෂිකව යාවත්කාලීන කරනු ඇත.

[13] The Essential Services Package is a guidance tool identifying the essential services to be provided to all women and girls who have experienced gender-based violence, including services that should be provided by the health, social services, police and justice sectors. This package also provides guidelines for the coordination of these services- https://www.unfpa.org/sites/default/files/pub-pdf/Essential-Services-Package-en.pdf

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) හි තාක්‍ෂණික සහය ඇතිව, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් හා කොට්ඨාස මට්ටමෙන් බහු-ආංශික සේවා සපයන්නන් සමග රැස්වීම් ගණනාවක් පවත්වන ලදි. විවිධ සහභාගිවන්නන් සමග කල රැස්වීම් සහ උපදේශාත්මක හමු හරහා ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් යොමු කිරීමේ මාර්ගයන්, ප්‍රාදේශීය කමිටුවේ ව්‍යුහයන් (TRO) සහ ක්‍රියාකාරී සැලසුම් හඳුනාගන්නා ලදි. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් සඳහා වන ප්‍රධාන පෙළේ සේවා සපයන්නන් සමග උපදේශාත්මක හමු පැවැත්වූ අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගීවූවෝ ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයෙනි. එසේම, තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 හි සෞඛ්‍ය, පොලිස් සහ යුක්තිය හා සමාජ සේවා අංශ සහ සිවිල් සංවිධාන නියෝජිතයින්ගෙන් ද උපදෙස් ලබා ගන්නා ලදි.

**හම්බන්තොට** - තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 36 (කාන්තා 19 සහ පිරිමි 17), හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 38 (කාන්තා 20 සහ පිරිමි 18), සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 43 (කාන්තා 21 සහ පිරිමි 22) සහ ලුනුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 32 (කාන්තා 15 සහ පිරිමි 17) ආදී වශයෙන් සේවා සපයන්නන් සහභාගී වූ ඉහත සඳහන් මූලික රැස්වීම් ප්‍රාදේශීය ලේකම් තුමා/තුමිය හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයෙකු විසින් සම්බන්ධීකරණය කරන ලද අතර අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නියෝජනය කරන වනිතා සංවර්ධන නිලධාරීන් විසින් මෙහෙයවන ලදි.

**මන්නාරම** - මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 51 (කාන්තා 18 සහ පිරිමි 33), නනාතන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 54 (කාන්තා 21 සහ පිරිමි 33), මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 75 (කාන්තා 40 සහ පිරිමි 35) සහ මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 85 (කාන්තා 60 සහ පිරිමි 25) ආදී වශයෙන් සේවා සපයන්නන් සහභාගී වන ලදි.

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් පලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් යොමු කිරීමේ මාර්ග සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයේ ඇති වැදගත්කම පිළිබඳ පොදු සම්මුතියකට එළඹීම සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් පිළිබඳ වින්දිතයින්ට පලදායීව සේවා සැපයීමට ඇති අවශ්‍යතාවයන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් හඳුනා ගැනීම පිණිස අදාල දිස්ත්‍රික්ක දෙකෙහිම උපදේශක හමු 2 ක් පවත්වන ලදි. මන්නාරම දිස්ත්‍රික් උපදේශක හමුව සඳහා සේවා සපයන්නන් 86 ක් (කාන්තාවන් 61 ක් සහ පිරිමින් 25 ක් ) සහභාගී වූ අතර හම්බන්තොට දිස්ත්‍රික් රැස්වීමට සේවා සපයන්නන් 60 ක් (කාන්තාවන් 37 ක් සහ පිරිමින් 23 ක් ) සහභාගී වූ ඔවුන් සියල්ලෝම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් වූහ.

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් ආමන්ත්‍රණය කිරීම පිණිස වන සේවාවන් සහ සම්බන්ධීකරණයේ ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා ඉහළ

නැංවීම සඳහා කාන්තා හා ළමා සංවර්ධන ඒකක, විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්, පොලිස් කාන්තා හා ළමා කාර්යාංශයේ නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් ඇතුළු සේවා සපයන්නන් 279 දෙනෙකුගේ වෙනුවෙන් ධාරිතා සංවර්ධන පුහුණු සැසි පවත්වන ලදි. සමස්ත ක්‍රියාවලිය තුළ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් සමග පවත්වා ගත් සබඳතාවය යොමු කිරීම් පද්ධතිය සඳහා වන මෙම මාර්ගෝපදේශයන් සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණය සංවර්ධනය කර ගැනීම වැඩිදියුණු කරන ලදි.

### මූලික හේතුව (තාර්කිකත්වය)

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් රට තුළ බහුලව දක්නට ලැබෙන මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් එකක් වන අතර එය පොදු මහජන සෞඛ්‍ය ගැටළුවක් ද වේ. එම තත්වය වින්දිතයින් සහ අනෙකුත් අගතියට පත් අයගේ මෙන්ම සිය පවුල් වල හා ප්‍රජාවන්ගේ සෞඛ්‍ය, මනෝ-සමාජීය සහ ආර්ථික යහපැවැත්මට සැලකිය යුතු හා දිගු කාලීන බලපෑම් ඇති කරයි. කාන්තාවන් සහ ගැහැණු ළමුන් සිය ජීවිත කාලය තුළ පිරිමින් සහ පිරිමි ළමුන්ට වඩා පුද්ගලික හා පොදු අවකාශයන් තුළ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් අත්විඳින්නේ පවත්නා පුරුෂාධිපත්‍යමය ආකල්ප හා සම්මතයන් නිසාය[14].

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට 2016 දී දියත් කරන ලද ජන විකාශන හා සෞඛ්‍ය පිළිබඳ සමීක්ෂණයේදී ගෘහස්ත හිංසනය සහ සමීප සහකරු හිංසනය පිළිබඳ කාන්තාවන්ගේ අත්දැකීම් පිළිබඳ ප්‍රශ්ණ සහිත මොඩියුලයක් ඇතුළත් කරන ලද අතර එම සමීක්ෂණයේ ප්‍රධාන සොයා ගැනීම් පහත දැක්වේ[15];

- **ගෘහස්ත හිංසනයේ ව්‍යාප්තිය:** ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 15 - 49 ත් අතර විවාහක කාන්තාවන්ගෙන් 17% ක් සිය සමීප සහකරුගෙන් ගෘහස්ත හිංසනය පීඩා විඳ ඇත.
- **ගෘහස්ත හිංසනයේ ආකාරයන්:** ගෘහස්ත හිංසනයට මුහුණ දෙන එම විවාහක කාන්තාවන්ගෙන් 2% ක්, කිසියම් හෝ ආකාරයක ගෘහස්ත හිංසනයකට දිනපතා මුහුණ දෙති.
- **ගෘහස්ත හිංසනයේ වෙනස්කම්:** සමීප සහකරු අතින් හිංසනයට පත්වන කාන්තායන්ගේ වයසත් සමග එම හිංසනයේ ව්‍යාප්තිය වැඩි වේ. පොදුවේ ගෘහස්ත හිංසනයේ ඉහළම ප්‍රතිශතය (20%) නාගරික පුරවැසියන් අතරින් වාර්තා වූ අතර, කිලිනොච්චිය සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල ඉහළම ප්‍රතිශතය (50% ක් ) වාර්තා විය. විවාහක කාන්තාවන් අතරින් වත්කම අතින් අඩුම කාන්තාවන් සහ ප්‍රාථමික අධ්‍යාපනය සහිත කාන්තාවන් ගණයට අයත් කාන්තාවන් පිලිවෙලින් 28% ක් සහ 30% ක් වු ඉහළම ගෘහස්ත හිංසන වින්දිතයින් ලෙස වාර්තා විය.
- **ගෘහස්ත හිංසනය කෙරෙහි සේවා:** ගෘහස්ත හිංසනයෙන් පීඩා විඳින කාන්තාවන්ගෙන් හතරෙන් එකක් පමණක් (28% ක්) සහය සේවා පතා ඇති අතර ඔවුන් අතරින් හතරෙන් තුනක් (75% ක්) සිය පවුලේ සාමාජිකයෙකුගෙන් ද, 27% ක් තම මිතුරෙකුගෙන් හෝ අසල්වැසියෙකුගෙන් උපකාර පතා ඇති අතර පොලිස් සහය පතා ඇත්තේ 18% ක් පමණි. වයස අවුරුදු 15 - 49 ත් අතර විවාහක කාන්තාවන්ගෙන් අඩක්ම (50%ක්) හිංසනයට එරෙහිව ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලිසියේ කාන්තා හා ළමා කාර්යාංශය පිළිබඳ දැනුවත්ව සිටි අතර 26% ක් පවුල් සෞඛ්‍ය සේවිකාව සහ කාන්තා උපකාරක සේවාව ගැන සඳහන් කලහ.

(මූලාශ්‍රය: DHS 2016 - 13 වන පරිච්ඡේදය)

[14] https://www.unhcr.org/583577ed4.pdf
[15] http://www.statistics.gov.lk/social/DHS_2016a/Chapter13.pdf

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් එහි වින්දිතයින්ට කෙරෙහි ඇති කරන බලපෑම විවිධ ස්වරූප ගනී. එබැවින්, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට ගොදුරු වූ අයගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම පිණිස බහු-ආංශික ප්‍රවේශයක අවශ්‍යතාවය ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් අත්විඳින කිසියම් කාන්තාවකගේ හෝ ගැහැණු ළමයෙකුගේ අයිතිවාසිකම්, ආරක්ෂාව සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සෞඛ්‍ය සේවා, සමාජ සේවා, පොලිස් සහ යුක්තිමය සේවා යන අංශ මගින් සැපයිය යුතු ප්‍රධාන සේවා සමූහයක් ''අත්‍යාවශ්‍ය සේවා'' ලෙස අත්‍යාවශ්‍ය සේවා පැකේජය හඳුනා ගෙන ඇත [16]. ශ්‍රී ලංකාවේ ද, සෞඛ්‍ය සේවා, සමාජ සේවා, පොලිස් සහ යුක්තිමය සේවා ඇතුළු විවිධ අංශවල ක්‍රියාකාරකයින් ලිංගික හා ස්ත්‍රී ආමන්ත්‍රණය කිරීම සඳහා විශේෂයෙන්ම නිර්මාණය කර ඇති සේවා ඇත. කෙසේ වෙතත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් බහු-ආංශික සේවා සපයන්නන් අතර සම්බන්ධීකරණය තවදුරටත් වැඩිදියුණු කිරීමට ඉඩකඩ ඇත. මෙම මාර්ගෝපදේශයන් මගින් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් අදාළ *ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි (2016 - 2020)* නිර්දේශ කර ඇති පරිදි පලදායීව හා කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීම පිණිස අදාළ සේවා සපයන්නන් අතර බහු-ආංශික යොමු කිරීමේ පද්ධතිය සහ සම්බන්ධීකරණය වැඩිදියුණු කරනු ඇතැයි විශ්වාස කෙරේ. පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්

**දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් යොමු කිරීමේ පද්ධතියක් පැවතීමේ වාසිදායක තත්වයන් කිහිපයක් ඇති අතර, ඊට ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ;**

1. වින්දිතයින්ට අවශ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සහ ඔවුන්ට ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් පිළිබඳ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ස්ථාපිත බහු-ආංශික සේවා සපයන්නන්ගෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම.


2. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් පිළිබඳ සිද්ධීන් සඳහා හඳුනාගත් සම්බන්ධීකරණ නියෝජිත ආයතනයක් (WDO) සහ සේවා සැපයීමේ දී එම නියෝජිත ආයතන තුළ සිද්ධි කළමනාකරුවන් ලෙස ක්‍රියා කරන කේන්ද්‍රීය නිලධාරියෙකු හරහා කාර්යක්ෂම සිද්ධි කළමනාකරණයක් සහතික කිරීම.

3. යොමු කිරීමේ මාර්ගය හරහා අදාළ සිද්ධියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ සේවාවන්හි පවතින අඩුපාඩු හඳුනා ගැනීමට ඇති හැකියාව.

[16] https://www.unfpa.org/sites/default/files/pub-pdf/Essential-Services-Package-en.pdf

4. වඩාත් පලදායී හා කාර්යක්ෂම අයුරින් සේවා සැපයීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් මූල්‍ය හා මානව සම්පත් වඩා යෝග්‍ය ආකාරයෙන් භාවිතා කල හැකි වීම.

දිස්ත්‍රික්ක දෙකෙහි සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 තුළ සේවා සපයන්නන් සිතියම්ගත කිරීමේ දී ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් හි වින්දිතයින් යථා තත්වයට පත් කිරීම හා ප්‍රති සමාජගත කිරීම පිණිස පහත සඳහන් සේවාවන් අවශ්‍ය බව හඳුනාගෙන ඇත;




## ඉලක්ක කණ්ඩායම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වනිතා සංවර්ධන නිලධාරීන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නායකත්වයට සහ ළමා හා කාන්තා සංවර්ධන ඒකකවල නිලධාරීන්ට මග පෙන්වීම මෙම මාර්ගෝපදේශවල අරමුණයි.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හා කාන්තා සංවර්ධන ඒකක (CWDU) පිහිටුවා ඇති අතර ඒවා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විතය;

1. වනිතා සංවර්ධන නිලධාරීන් (WDO) සහ /හෝ වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහායකයින් (WDFA)
2. උපදේශන නිලධාරීන් (CO) සහ/හෝ සහයකයින් (CA)
3. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී (CRPO) සහ/හෝ සහයකයින් (CRPA)
4. මුල් ළමාවිය සංවර්ධන නිලධාරී (ECDO) සහ/හෝ සහයක (ECDA)
5. ළමා ආරක්ෂණ නිලධාරී (CPO) සහ/හෝ ළමා ආරක්ෂණ සහයක (CPA)

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් පිළිබඳ සේවා කෙරෙහි යොමු කිරීම් පද්ධතිය හා සම්බන්ධ සෞඛ්‍ය අංශ සේවා සපයන්නන්, සමාජ, ආර්ථික සහ අධ්‍යාපනික සේවා සපයන්නන් මෙන්ම පොලිස් හා යුක්තිමය සේවා අංශ නිලධාරීන් ද මෙම මාර්ගෝපදේශයන් අනුගමනය කරනු ඇත.

## නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුව

### ජාතික නෛතික රාමුව

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව :** ජාතික නෛතික රාමුව සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලිකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කාන්තාවන්ට සමානාත්මතාවය කෙරෙහ ඇති අයිතිය, භාෂණයේ, රැස්වීමේ, සංගමයේ (ඇසුරු කිරීමේ), ඔබමොබ යාමේ නිදහස සහ වධ හිංසාවෙන් නිදහස් වීමේ මෙන්ම නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහතික කරයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තියේ සඳහන් වන්නේ, 'නීතිය ඉදිරියේ සියළුම පුද්ගලයින් එක හා සමාන වන අතර නීතියේ සමා ආරක්ෂාවට සැමට හිමිකම් ඇති බවයි'.

එහි 12 (2) වගන්තියේ සඳහන් වන්නේ, 'ලිංගිකත්වය පදනම් කරගෙන කිසිඳු පුරවැසියෙකුට වෙනස්කම් නොකල යුතුය'

**ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය;** ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ක්‍රියාවන් බොහොමයක් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ අපරාධ සේ සැලකේ. මුලින් 1883 දී සම්පාදනය කරන ලද අතර පසු කාලයේ 1995 සහ 1996 වසර වලදී ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ප්‍රගතිශීලී වෙනස්කම් සහිතව මෙම දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන ලදි. මෙම සංශෝධන මගින් ව්‍යභිචාරය (එස්. 364 ඒ), බරපතළ ලිංගික අපයෝජනය (එස්.365 බී), ළමයින්ට කෲර වද හිංසා පැමිණවීම (එස්. 308 ඒ) සහ ලිංගික හිරිහැර

සම්බන්ධව නව අපරාධ ඇතුළත් වූ අතර ස්ත්‍රී දූෂණය (එස්. 345) සහ ලිංගික හිංසනය පිළිබඳ පවත්නා විධිවිධාන වෙනසට ළක් විය.

**ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත (2005):** දණ්ඩ නීති සංග්‍රහයේ xvi වන පරිච්ඡේදය යටතේ සඳහන් කර ඇති අපරාධයන් ගෘහස්ත හිංසන ලෙසත්, මානසික හිංසනය ගෘහස්ත හිංසන ආකාරයක් ලෙසත් පිළිගෙන ඇති අතර එවැනි අපරාධ සඳහා අධිකරණය විසින් ආරක්ෂණ නියෝගයක් මගින් කඩිනම් පිළියමක් ද සලසයි.

**අපරාධයන්හි වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත (2015):** අපරාධවලට ගොදුරු වුවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසකම් පිළිබඳ ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුව මෙම පනත බලපැවැත්වේ. මෙම පනත මගින් සමානාත්මතාවය, සාධාරණත්වය, පෞද්ගලිකත්වය, කඩිනම් හා සාධාරණ ප්‍රතිකර්මයක් ලබා ගැනීම සහ හානියෙන් ආරක්ෂා වීමේ අයිතිය සහතික කරන අතර ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට මුහුණ දුන් කාන්තාවන් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

**මෙම නීති පැවතුනද, කාන්තාවන්ට වෙනස් කොට සැලකෙන මෙන්ම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් නීතිගත කෙරෙන ආකාරයේ නීති ගණනාවක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයේ දැඩි අවධානය යොමුවිය යුතුව ඇත. උදාහරණ වශයෙන් මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951), අයාල ආඥා පනත (1841) සහ වෛවාහක ස්ත්‍රී දූෂණය හා අදාළ දණ්ඩ නීති සංග්‍රහයේ ඇතැම් කොටස් දැක්විය හැක.

**ජාත්‍යාන්තර බැඳීම්**

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යාන්තර සම්මුතිය (ICCPR); ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යාන්තර සම්මුතිය (ICESCR); ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC); වද හිංසා පැමිණවීම සහ වෙනත් කෲර, අමානුෂික හෝ පහත් කොට සැලකීම් හෝ දඬුවම් (CAT) වලට එරෙහි සම්මුතිය සහ කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (CADAW) ඇතළු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් 9 ක්ම සඳහා ශ්‍රී ලංකාව එකඟතාවය පළ කර ඇත. කාන්තාවන්ගේ අයිතිවාසිකම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ගෝලීය සැලැස්මක් වන බීජිං වැඩසටහනට ද ශ්‍රී ලංකාවේ එකඟතාවය පළවී ඇත.

1979 හි එක්සත් ජාතීන්ගේ කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (CADAW) 1981 දී අනුමත කිරීමත් සමග, ශ්‍රී ලංකා රජය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වන ප්‍රතිපත්තිමය හා නීතිමය රාමු ශක්තිමත් කිරීම මෙන්ම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන සිදුවීම් පිළිබඳ කටයුතු කිරීම පිණිස ජාතික හා ප්‍රාදේශීය තලයේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමෙහි යෙදෙමින් සැලකිය යුතු ප්‍රයත්නයක යෙදී ඇත.

**ජාතික ප්‍රතිපත්තිය**

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016 - 2020): සෙසු ප්‍රධාන අමාත්‍යාංශ 09 කද සහයෝගය ඇතිව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් සම්පාදනය කරන ලද මෙම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්ගෙන් සමන්විත තාක්‍ෂණික කමිටු මගින් සකස් කරන ලද ආශ්‍රිත ආංශික සැලසුම් වලින් සමන්විතය.

## මෙහෙයුම් මූලධර්ම

පහත සඳහන් වන්නේ වින්දිතයින්/අගතියට පත් වුවන්ගේ අවශ්‍යතා කෙරෙහි ප්‍රතිචාර දැක්වීමේදී සේවා සපයන්නන් විසින් අනුගමනය කල යුතු මෙහෙයුම් මූලධර්ම කිහිපයකි;

### 1. වින්දිතයින්/අගතියට පත් වුවන් කේන්ද්‍රීය ප්‍රවේශය

වින්දිතයින්/අගතියට පත් අය කේන්ද්‍ර කරගත් ප්‍රවේශය මගින් සේවා සැපයීමේදී කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ගේ අවශ්‍යතා යන මධ්‍ය කාරණා නිසි ලෙස ඉලක්ක කර ගනී. මෙහිදී වින්දිතයින්/අගතියට පත් අයගේ බහුවිධ අවශ්‍යතා, අවධානම සහ අවදානම්පාත්‍රීභාවය, ගනු ලැබූ තීරණ සහ ක්‍රියාමාර්ගයන්ගේ බලපෑම ආදී කරුණු පිළිබඳ සැලකිලිමත් වීම මෙන්ම ඒ ඒ කාන්තාව සහ ගැහැණු ළමයාගේ අවශ්‍යතාවයන් අනුව සේවා සැපයෙන බවට තහවුරු කිරීම අවශ්‍යවේ. සේවා සැපයීම ඒ ඒ වින්දිතයාගේ/අගතියට පත් අයගේ කැමැත්ත අනුව සිදුවිය යුතුය [17]. වින්දිතයින්/අගතියට පත් අය කේන්ද්‍ර කරගත් ප්‍රවේශය මගින් ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කෙරෙන හා ඔවුන් වෙත බහුමානයෙන් යුතුව සලකනු ලබන පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරයි[18].

වින්දිතයින්/අගතියට පත් අය කේන්ද්‍ර කරගත් ප්‍රවේශය පහත සඳහන් මූලධර්මයන් මත පදනම් වේ[19];

- **ආරක්ෂාව:** වින්දිතයා/අගතියට පත් අයගේ සහ ඇයගේ/ඔහුගේ දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය යනු මූලික අවධානය යොමු විය යුතු කාරණයයි.

---

[17] UN Women, UNFPA, WHO, UNDP & UNODC (2015), Essential Services Package for Women and Girls Subject to Violence.

[18] GBV-Sub Cluster (Turkey Hub – Syria) (2019), Standard Operating Procedures for Gender-Based Violence Prevention and Response.

[19] https://www.unfpa.org/sites/default/files/pub-pdf/GBVIE.Minimum.Standard.Publication.FINAL

- **රහස්‍යභාවය:** සිය කතාව පවසන්නේ හෝ එසේ නොපවසන්නේ කා සමගද? යන්න තීරණය කිරීමට වින්දිතයාට අයිතියක් ඇති අතර අදාළ තොරතුරු අනෙකුත් පාර්ශවයන් සමග හුවමාරු කර ගැනීමට පෙර වින්දිතයා දැණුවත්ව පළ කල කැමැත්ත ලබා ගත යුතුය.
- **ගෞරවනීය බව:** සේවා සපයන්නනා විසින් ගනු ලබන සෑම තීරණයක්ම වින්දිතයාගේ තෝරා ගැනීම, කැමැත්ත, අයිතීන් සහ ගෞරවය රැකෙන ආකාරයට සිදුවිය යුතුය.
- **වෙනස්කොට නොසැලකීම:**වින්දිතයා/අගතියට පත් අයගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, වර්ගය, ආගම, ජාතිකත්වය, ජනවාර්ගිකත්වය, ලිංගික දිශානතිය හෝ වෙනයම් ලක්‍ෂණයක් නොසලකා හැර සමාන හා සාධාරණව සැලකිය යුතුය.

**2. පලමු හමුවේදී සැපයෙන වැදගත් සහය[20] (LIVES)**

වින්දිතයාගේ/අගතියට පත් අයගේ ජීවිතාරක්‍ෂාව පිණිස සැපයෙන ප්‍රාථමික සහය:

- **සවන් දීම :** සානුකම්පිතව සමීපව සවන් දීම, පූර්ව නිගමනයන්ගෙන් තොර වීම
- **වින්දිතයාගේ අවශ්‍යතා සහ වෙනත් උවමනා විමසීම :** ඇයගේ අවශ්‍යතා සහ වෙනත් උවමනා තක්සේරුව හා ඊට ප්‍රතිචාර දැක්වීම - (චිත්තාවේගී, කායික, සමාජීය සහ ළමා රැකවරණ සහය ආදී ප්‍රායෝගික සහය)
- **විශ්වාසය තහවුරුව :** හැඟීම් ප්‍රකාශනයෙ සහ ශරීර භාෂාව (අභිනය) හරහා ඔබ වින්දිතයා විශ්වාස කරන බව හැඟවීම
- **ආරක්‍ෂාව වැඩිදියුණු කිරීම :** ඇයව තවදුරටත් විය හැකි හානි වලින් මුදවා ගන්නා අයුරු සාකච්ඡා කිරීම
- **සහය ලබා දීම :** ඇය අදාළ තත්වයෙන් මුදවා ගැනීම පිණිස වන වෙනත් සේවා කෙරෙහි යොමු කිරීමට උපකාර කිරීම

**3. දරුවා කෙරෙහි උපරිම සැලකිලිමත් බව**

වින්දිතයා/අගතියට පත් අය දරුවකු වන අවස්ථාවලදී (වයස අවුරුදු 18 ට අඩු) තීරණ ගැනීමේදී, දරුවාගේ අයිතීන් කෙරෙහි සැලකිලිමත් විය යුතුය. තීරණ ගැනීමේදී වයස, ස්ත්‍රී පුරුෂ භාවය, සංස්කෘතික පසුබිම සහ දරුවාගේ අත්දැකීම් ආදී බොහෝ සාධක පිළිබඳ සලකා බැලිය යුතුය. මෙම මූලධර්මය පිළිබඳ ඕනෑම අර්ථ නිරූපණයක් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ප්‍රකාරව කල යුතු අතර එම කාරණාවලදී නීතිමය හා ළමා ආරක්‍ෂණ යන දෙආකාරයේම විද්වත් උපදෙස් කෙරෙහි නිසි ගෞරවය ලබා දිය යුතුය[21]. ශ්‍රී ලංකාවේ නීති රාමුව අනුව අධිකරණය දරුවෙකුගේ උත්තර භාරකරු ලෙස සැලකේ.

**4.ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයේ වින්දිතයාගේ/අගතියට පත් අයගේ දැණුවත්ව පළ කල කැමැත්ත**

[20] https://www.who.int/reproductivehealth/publications/participants-handouts.pdf?ua=1
[21] https://reliefweb.int/sites/reliefweb.int/files/resources/gbv_sc_sops_2018_english_final.pdf

දැණුවත්ව පළ කල කැමැත්ත යනු; වින්දිතයා/අගතියට පත් අය නිසි අවබෝධයෙන් යුතුව සිය කැමැත්තෙන් සහභගී වී අදාළ සිද්ධිය පිළිබඳ තොරතුරු ලබා දීමට සේවා සපයන්නා විසින් අවසරය ගැනීමයි. වින්දිතයාට/අගතියට පත් අයට එසේ දැණුවත් කැමැත් ලබා දීමට නම්, ඇයට අදාළ කරුණු , ගනු ලබන ක්‍රියාමාර්ග මෙන්ම ඒවායේ ප්‍රතිවිපාක පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. වින්දිතයාගේ/අගතියට පත් අයගේ දැණුවත්ව පළ කල කැමැත්ත ඇයට අදාළව කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ලබා ගත යුතුය. (උදා: සිද්ධිය පටිගත කිරීමට පෙර, සේවා සඳහා යොමු කිරීමට පෙර, වෛද්‍ය පරීක්ෂණයක් සිදු කිරීමට පෙර හෝ වින්දිතයා/අගතියට පත් අය පිලිබඳව හෝ අදාළ සිදුවීම පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමකට පෙර)

දරුවෙකු වෙනුවෙන් (වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙක්) භාරකරුවෙකු විසින් දැණුවත් කැමැත්ත ලබා දිය යුතුය.
මේ සඳහා සේවා සපයන්නන් එකඟතා පෝරමයක් අනුගමනය කල යුතු අතර එම පොරමයේ ආකෘතියක් මෙහි අමුණා ඇත (ඇමුණුම 1). මෙම පෝරමය ස්ව-භාෂාවෙන් ලබා දිය යුතු අතර සේවා ලාභියාට හෝ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයේ වින්දිතයා දරුවෙකු නම් අදාළ භාරකරුට සිය භාෂාවෙන් කියවිය යුතුය. එසේම එහි සඳහන් කර ඇති ඕනෑම විකල්පයක් අනුගමනය කිරීමට හෝ එම කිසිඳු විකල්පයකට එකඟ නොවීමට හැකියාව ඇති බව වින්දිතයාට හෝ භාරකරුට පැහැදිලි කර දිය යුතුය.

**පියවර 1**

- **සම්පූර්ණ තොරතුරු ලබා දීම**
- ප්‍රතිචාර ක්‍රියාවලිය, යොමු කිරීම්, සේවා සපයන්නා විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවලින් ගම්‍ය වන දේ මෙන්ම වින්දිතයින් ලෙස ඔවුන් සතු අයිතීන් - ඕනෑම අවස්ථාවක ඕනෑම සේවාවක් හෝ එහි කොටසක් ඉවත් කර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඔවුන්ට ඇති අයිතිය ද ඇතුළුව

**පියවර 2**

- **රහස්‍යභාවය පිළිබඳ බවතින සීමාවන් පැහැදිලි කර දීම**
- ඔවුන්ගේ තොරතුරු ඇතැම්විට අන් සේවා සපයන්නන් හා හුවමාරු කර ගැනීමට සිදු වන බව හා එසේ කරන්නේ කුමණ අවශ්‍යතාවයන් මතද? යන්න වටහා දීම

**පියවර 3**

- **කැමැත්ත ඉල්ලා සිටීම**
- කැමැත්ත කිසිඳු බලපෑමකින් තොරව ලබා දිය යුතු අතර සිද්ධි කලමණාකරණයේදී හැකිතාක් ලිඛිත කැමැත්ත ලබා ගත යුතුය

**පියවර 4**

- **කැමැත් පිළිබඳ සීමාවන් තීරණය කිරීම**
- කුමණ ආකාරයේ තොරතුරු කුමණ සංවිධාන හා හුවමාරු කර ගත යුතු හෝ නොකල යුතු දැයි සීමා නීර්ණය කිරීමට  වින්දිතයාට අයිතිය ඇත

## දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොර්ට්ඨාස මට්ටමේ යොමු කිරීමේ පද්ධතිය:

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයේ වින්දිතයා කාලෝචිත, ආරක්ෂිත සහ රහස්‍යභාවයෙන් යුත් සුදුසු හා ගුණාත්මක බහු - ආංශික සේවාවන් සමග සම්බන්ධ කිරීම සඳහා යොමු කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.  මෙහිදී සේවා සපයන්නන්ට ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන කෙරෙහි නිසි ප්‍රතිචාර දැක්වීම පිණිස අවශ්‍ය තොරතුරු ලබා දෙන අතර වින්දිතයින්ට ප්‍රතිකර්ම සඳහා අවශ්‍ය ගුණාත්මක හා කාලීන සේවාවන් සපයනු ඇත.  එය වින්දිතයින්ගේ මානව අයිතිවාසිකම් සුරැකීම හා ප්‍රවර්ධනය පිණිස සිවිල් සමාජ සංවිධාන (CSOs) සමග සහයෝගයෙන් රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන සාමූහික වැඩසටහනකි.

යොමු කිරීමේ පද්ධතියක් සඳහා අවම වශයෙන් පහත සඳහන් කාරණා සැපිරිය යුතුය;

(1) යෝග්‍ය බහු-ආංශික සේවා සපයන්නන්ගේ ජාලයක්


(2) ඒ ඒ දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වන සේවාවල නාමාවලියක්

(3) වින්දිතයින්ගේ කාලීන, ආරක්ෂිත සහ රහස්‍යභාවයෙන් යුත් සේවාවන් කෙරෙහි ප්‍රවේශ වීමට සහය සලසන ප්‍රමිතියෙන් යුත් මනාව ස්ථාපිත යොමු කිරීමේ මාර්ගයක් හෝ පද්ධතියක්[22].

## ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන කෙරෙහි බහු-ආංශික ප්‍රතිචාර දැක්වීම පිණිස වන කොට්ඨාස මට්ටමේ ව්‍යුහය

[22]UNFPA's The Inter-Agency Minimum Standards for Gender-Based Violence in Emergencies Programming, 2019

හිංසනයන්ට මුහුණ දෙන වින්දිතයින් සඳහා විවිධ සේවා සපයන මූලික සේවා අංශ 3 ක (අත්‍යාවශ්‍ය සේවා පැකේජය අනුව) සේවා පහත රූප සටහනෙන් පෙන්නුම් කරයි. මෙම මාර්ගෝපදේශයන්ගේ අවධානය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ යොමු කිරීම් ක්‍රමය ඉලක්ක කර ඇති බැවින්, මන්නාරම සහ හම්බන්තොට යන ප්‍රදේශ වල පහත සඳහන් සේවා සපයන්නන් ප්‍රධාන පාර්ශව කරුවන් ලෙස හඳුනාගෙන ඇත.



## යොමු කිරීමේ පද්ධතියක අත්‍යාවශ්‍ය අංග

**1. යොමු කිරීමේ ජාලය**

- හිංසනයන්ට මුහුණ දී ඇති වින්දිතයින් සහ ඔවුන්ගේ පවුල්වලට සිය අවශ්‍යතා ඉටු කෙරෙන පරිදි පුළුල් සේවා සපයන්නන් ලෙස හඳුනාගත් සේවා සපයන්නන් සමූහයක්

**2. හඳුනාගත් සම්බන්ධීකරණ නියෝජිත ආයතනයක් (WDO)**

- යොමු කිරීමේ ජාලය සම්බන්ධීකරණය හා සුපරීක්ෂණය කරන රාජ්‍ය නියෝජිත ආයතනයක්

**3. යොමු කිරීමේ මාර්ගයක් ස්ථාපිත කිරීම**

- වින්දිතයාට අවශ්‍ය සේවා ලබා ගැනීම පිණිස යොදා ගත හැකි හඳුනාගත් යොමු කිරීමේ මාර්ගයක්

**4. සෑම සේවා සපයන්නෙකුගෙන්ම හඳුනාගත් කේන්ද්‍රීය නිලධාරියෙක්**

- යොමු කිරීමේ සේවා පලදායී ලෙස සැකසීමේ වගකීම ඇති සහ සේවා සපයන හා රැස්වීම් නියෝජනය කරන

**5. සේවා නාම ලේඛනයක්**

- සේවා සපයන්නාගේ නම, ස්ථානය, සංවිධානය සම්බන්ධ කරගත හැකි අංක, සේවා වර්ගය සහ කේන්ද්‍රීය නිලධාරියාගේ නම ඇතුළු අදාළ භූගෝලීය ප්‍රදේශයේ පවතින සේවා නාම ලේඛනයක් සැපයීම

**6. ප්‍රමිතිගත යොමු ආකෘති/පෝරම**

- යොමු කිරීමක් ආරම්භ කරන සෑම විටම එකම ආකාරයේ අත්‍යාවශ්‍ය තොරතුරු ලබා දෙන බවට සහ සේවා සපයන්නන් යොමු කිරීම සම්පූර්ණ කර ගැනීම පිණිස තොරතුරු ලබා ගත් බව සහතික කිරීම පිණිස යොමු කිරීමේ මාර්ගයේ සාමාජිකයින් විසින් ප්‍රමිතිගත යොමු ආකෘති/පෝරම භාවිතා කල යුතුය

**7. යොමු කිරීම් පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලියක්**

- සේවා ලාභීන් ඔවුන්ට අවශ්‍ය සේවා ලබා ගැනීම පිණිස අදාළ සේවා වෙතයොමු වූ බව සනාථ කිරීම පිණිස යොමු කිරීම් පිළිබඳ පසුවිපරම් ක්‍රමයක්

**8. සම්බන්ධීකරණ රැස්වීම්**

- සෑම සේවා සපයන්නෙක්ම විටින් විට එක්රැස් කර අත්කරගත් සාර්ථකත්වයන් හා පවතින අඩුපාඩු හඳුනා ගැනීම මෙහිදී අත්‍යාවශ්‍යය

## අත්‍යාවශ්‍ය අංග 1: යොමු කිරීමේ ජාලය

මෙම මාර්ගෝපදේශයන්හි අවධානය විශේෂයෙන්ම හම්බන්තොට සහ මන්නාරම යොමු කිරීමේ පද්ධති ඇතුළු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තලයේ යොමු කිරීමේ යාන්ත්‍රණයන් ඉලක්ක කර ගෙන ඇති හෙයින්, සිදුකරන ලද සිතියම්කරණ අභ්‍යාසය හරහා පහත දැක්වෙන සේවා සපයන්නන් ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ යොමු කිරීමේ ජාලයට වඩාත්ම සම්බන්ධ වූවන් ලෙස හඳුනාගෙන ඇත.

| අංකය | අංශය | රාජ්‍ය සේවා සපයන්නන් |
|---|---|---|
| 1 | නායකත්ව හා පරිපාලන | දිස්ත්‍රික් ලේකම්, සහකාර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම්වරු |
| 2 | ළමා කටයුතු | මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් සහ සහායකයින්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සහ සහයක,ළමා ආරක්ෂණ නිලධාරීන් සහ සහායක, මනෝ-සමාජ සංවර්ධන නිලධාරී |
| 3 | ආපදා කළමනාකරණ | සහකාර අධ්‍යක්‍ෂ, ආපදා කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය |
| 4 | ආර්ථික සංවර්ධන හා රැකියා | පරිපාලන සමෘද්ධි නිලධාරීන්, සහකාර අධ්‍යක්‍ෂ - සැලසුම් (ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රධානියා), සහකාර කම්කරු කොමසාරිස්, විද්‍යාතා මධ්‍යස්ථාන නිලධාරීන් |
| 5 | අධ්‍යාපන | කලාප අධ්‍යාපන කාර්යාල අධ්‍යක්‍ෂවරු |
| 6 | බලගැන්විසහ වැළැක්වීම | දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වනිතා සංවර්ධන නිලධාරීන්, සමාජ සුබසාධන නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පුරුවැසි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, සමාජ සේවා නිලධාරීන් |
| 7 | විදේශ රැකියා | දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විදේශ රැකියා පිළිබඳ සංවර්ධන නිලධාරීන් |
| 8 | සෞඛය | අධ්‍යක්‍ෂ/රෝහල් ප්‍රධානීන්<br>විශේෂඥ - අධිකරණ වෛද්‍ය නිලධාරී, විශේෂඥ - මනෝ-චිකිත්සක<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ප්‍රධානී, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්‍ෂ, උපදේශන නිලධාරීන්, පවුල් උපදේශන නිලධාරීන් |
| 9 | යුක්තිය හා නීති ප්‍රතිසංශෝධන | නීති නිලධාරීන්- නීති ආධාර කොමිසම, පොලිස් කොට්ඨාසවල පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී සහ පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරු, පොලිස් කාන්තා හා ළමා කාර්යාංශ වෙත අනුබද්ධිත ස්ථානාධිපතීන්, ක්වාසි විනිසුරුවන්, පරිපාලන නිලධාරීන්, සමථ මණ්ඩල සභාපතීන්, ප්‍රජා විශුද්ධිකරණ නිලධාරීන්, ග්‍රාම නිළධාරීන් |
| 10 | මාධ්‍ය | තොරතුරු නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල මාධ්‍ය ඒකකය |

## අත්‍යාවශ්‍ය අංග 2: හඳුනාගත් සම්බන්ධීකරණ නියෝජිත ආයතනය :WDO)

දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණ නියෝජිතයින් ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණයේ නියුතු වනිතා සංවර්ධන නිලධාරිනියන් කටයුතු කරන අතර ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ ප්‍රාදේශීය මට්ටමේ යොමු කිරීමේ පද්ධතීන්හි නියෝජිතයින් ලෙස ප්‍රාදේශීය තලයේ සම්බන්ධීකරණ කටයුතුවල නියුතු වනිතා සංවර්ධන නිලධාරිනියන් කටයුතු කරයි.

සම්බන්ධීකරණ නියෝජිතයින් ලෙස, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් සම්බන්ධ වන වනිතා සංවර්ධන නිලධාරිනියන් සෙසු කාරණා අතර පහත සඳහන් කාර්යන් කෙරෙහි වගකීම දරනු ඇත;

- යොමු කිරීමේ ජාලය තුළ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් වශයෙන් යොමු කිරීම් සම්බන්ධීකරණය පිණිස එක් එක් සේවා සපයන්නන් අතරින් කේන්ද්‍රීය නිලධාරියෙකු පත් කර ගැනීම.
- යොමු කිරීමේ ජාලයේ සේවා සපයන්නන් සමග රැස්වීම්, උපදේශක හමු සහ සිද්ධි පිළිබඳ සාකච්ඡාවන් පැවැත්වීම.
- යොමු කිරීම් පිළිබඳ නිසි ක්‍රියාමාර්ග නොගැනීම හෝ පමාවන් සඳහා විසඳුම්, පසුවිපරම් යාන්ත්‍රණ සහ යොමු කිරීම් පිළිබඳ වාර්තා කිරීම් වැඩිදියුණු කිරීම, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට මුහුණ දුන් වින්දිතයින් සඳහා වන සේවාවල පවතින අඩුපාඩුකම් හඳුනා ගැනීම සහ එම අඩුපාඩු මැඩ පවත්වා ගැනීම පිණිස ක්‍රියාමාර්ගයන් හඳුන්වා දීම, දැනුම, උපායමාර්ග හා වඩාත්ම හොඳ භාවිතයන් හුවමාරුව සහ යොමු කිරීම් පද්ධතිය පිළිබඳ තක්සේරු කිරීම මෙන්ම එය වඩා පලදායී කල හැක්කේ කෙසේද? යන්න විමසා බැලීම ආදී කරුණු ඇතුළුව සේවා සපයන නියෝජිතයින් අතර ඇතිවිය හැකි බොහෝ මෙහෙයුම් ගැටළු පිළිබඳ පසුවිපරම් කිරීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන සිද්ධීන් සහ වින්දිතයින් සඳහා සපයන ලද සේවා පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- පවතින සම්පත් හා යොමු කිරීම් සේවා ලේඛනයක් පවත්වා ගැනීම සහ යාවත්කාලීන කිරීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ පවතින ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ ගැටළු ඉදිරිපත් කරමින් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත වාර්තා යොමු කිරීම.
-

## අත්‍යාවශ්‍ය අංග 3: යොමු කිරීමේ මාර්ගය

- ප්‍රජා සම්පත්, පවතින සේවා, යොමු කිරීම් සඳහා වන අවශ්‍යතා, ප්‍රවේශය සඳහා ඇති බාධක සහ යොමු කිරීම් ජාලය පවතින සහය සේවා ජාතික ව්‍යුහයන් සමග සම්බන්ධ වන්නේ කෙසේද? යන්න හඳුනා ගැනීම පිණිස ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ සේවා සිතියම්කරණයක් සහ උපදේශන හමු පවත්වන ලදි. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ සේවා සිතියම්කරණය සඳහා ආකෘති සාම්පලයක් **ඇමුණුම් 2** මගින් සපයා ඇත.

- එක් නියෝජිත ආයතනයකින් තවත් ආයතනයක් වෙත යොමු කිරීම් ගමන් කිරීමේ ප්‍රවාහය හඳුනා ගන්නා ලදි.
- යොමු කිරීම් මාර්ගයේ එක් එක් සේවා සපයන්නාගේ වගකීම් හා කාර්යභාරයන් නිර්වචනය කර ඇති අතර යොමු කිරීම් මාර්ගය තුළ ඔවුන්ගේ රාජකාරිමය විධිවිධාන හා අපේක්ෂාවන් පිළිබඳව රැස්වීම් වලදී සාකච්ඡා කර එකඟ වන ලදි.
- ඊට අමතරව, සේවා සපයන්නන් කුමණ පෝරම භාවිතා කල යුතුද?, සැපයිය යුතු සේවා මොනවාද? සහ ඒ කුමණ මට්ටමින්ද? යන කරුණු ඇතුළුව ඔවුන්ගේ ප්‍රොටෝකෝලයන් සහ ක්‍රියාපටිපාටීන් වලට එකඟ විය. මෙම ක්‍රියාපටිපාටීන් ලිඛිතව ඇත්නම් මෙන්ම එක් එක් සාමාජිකයා වෙත පිටපතක් ලබා දිය හැකි නම් එය ප්‍රයෝජනවත් වේ.

## අත්‍යාවශ්‍ය අංග 4:සෑම සේවා සැපයුම් අංශයකින්ම හඳුනාගත් කේන්ද්‍රීය නිලධාරියෙක්

සේවා සිතියම්ගත කිරීමේ අභ්‍යාසය සහ ඉන් පසුව පවත්වන ලද උපදේශක හමු අතරතුර, යොමු කිරීමේ පද්ධතියේ සෑම සේවා සපයන්නෙකුටම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිලිබඳ සිද්ධීන් යොමු කල විට ඒවා මෙහෙයවීමට කේන්ද්‍රීය පුද්ගලයෙක් හඳුනා ගැනීම අවශ්‍ය විය. මෙම කේන්ද්‍රීය පුද්ගලයා අදාළ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිලිබඳ සිද්ධිය කළමනාකරණය කිරීම, සේවා සැපයීම සහ යොමු කිරීමේ මාර්ගය තුළ තවදුරටත් යොමු කිරීම් කාර්යක්ෂමව සිදු කිරීම පිළිබඳ වගකීම දරයි. **(ඔහු/ඇය සේවා සපයන ආයතන තුළ සිද්ධි කළමනාකරු විය යුතුය. සිද්ධි කළමනාකරණය පිළිබඳ කොටසට පහළින් බලන්න)**

## අත්‍යාවශ්‍ය අංග 5: සේවා සපයන්නන්ගේ නාම ලේඛනයක්

සේවා පිළිබඳ සිතියම්කරණයෙන් ලබා ගත් තොරතුරු අනුසාරයෙන් සේවා නාමාවලියක් සම්පාදනය කරන ලදි. මෙම සේවා නාමාවලිය; අදාළ භූගෝලීය ප්‍රදේශය තුළ ලබා ගත හැකි සේවාවන්, සේවා සැපයුම් නියෝජිත ආයතනයේ නම, ස්ථානය සහ ඒවා සම්බන්ධ කරගත හැකි දුරකතන අංක ආදී තොරතුරු, සපයා ඇති සේවා පිළිබඳ තොරතුරු සහ පත් කර ඇති කේන්ද්‍රීය නිලධාරියාගේ නම ආදී කරුනු ඇතුළත් වේ.

මෙම සේවා නාමාවලිය අදාළ යොමු කිරීම් පද්ධතියේ සියළුම කේන්ද්‍රීය නිලධාරීන් වෙත ලබා දිය යුතුය. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ සේවා නාමාවලිය සඳහා සාම්පලයක් **ඇමුණුම් 3** මගින් සපයා ඇත.

## අත්‍යාවශ්‍ය අංග 6:ප්‍රමිතිගත යොමු කිරීමේ ආකෘති

යොමු කිරීමක් ආරම්භ කරන සැම විටම එකම ආකාරයේ අත්‍යාවශ්‍ය තොරතුරු ලබා දෙන බවට සහ සේවා සපයන්නන් යොමු කිරීම සම්පූර්ණ කර ගැනීම පිණිස තොරතුරු ලබා ගත් බව සහතික කිරීම පිණිස යොමු කිරීමේ මාර්ගයේ සාමාජිකයින් විසින් ප්‍රමිතිගත යොමු ආකෘති/පෝරම භාවිතා කල යුතුය.

යොමු කිරීම් සඳහා පෝරමයක/ආකෘතියක සාම්පලයක් **ඇමුණුම් 4** මගින් සපයා ඇත.

## අත්‍යාවශ්‍ය අංග 7:යොමු කිරීම් පිළිබඳ පසුවිපරමක්

